2019. 07. 13. දිනමිණ    පිටු 1, 6

### උද්ධමනය 4%- 6% මට්ටමේ තියා ගන්න

# මහ බැංකුව පොලී අනුපාත වෙනස් නොකරයි

**ජයසිරි මුණසිංහ**

උද්ධමනය සියයට 4 - 6 මට්ටමේ තබා ගැනීමේ අරමුණින් මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාත වෙනස් නොකිරීමට පෙරේද (11) තීරණය කොට තිබේ.

උද්ධමනය සියයට 4 - 6 මට්ටමේ තබා ගැනීමේ අපේක්ෂාව හා අරමුණ සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව තබා ගැනීමට පෙරේද (11) තීරණය කළ බව මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ප්‍රකාශ කෙළේය.

කොළඹ, කොටුව මහ බැංකු මූලස්ථානයේ පෙරේද සවස පැවැති මුදල් ප්‍රතිපත්ති විවරණ 2019 දනුම් දීමේ 04 වැනි මාධ්‍ය හමුවට එක්වෙමින් අධිපතිවරයා මේ බව කියා සිටියේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ඉකුත් 11වැනි දින පැවැති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය 06 වැනි පිටුවට

## මහ බැංකුව...

(SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින්, සියයට 7.50 සහ සියයට 8.50ක් ලෙස දැනට පවතින මට්ටමේම නොවෙනස්ව පවත්වාගෙන යැමට තීරණය කළේය.

දැනට පවතින සහ අපේක්ෂිත දේශීය ආර්ථිකයේ, මූල්‍ය වෙළෙඳ පොළෙහි මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතාවන් මනාව සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය මේ තීරණය ගනු ලැබීය. මුදල් මණ්ඩලයේ මේ තීරණය, උද්ධමනය සියයට 4 - 6 අතර අපේක්ෂිත පරාසය තුළ පවත්වා ගැනීමේ අරමුණ සමඟ අනුකූල වන අතර, මැදිකාලීන ආර්ථිකයට සිය විභව වර්ධන මට්ටමට ළඟාවීම සඳහා සහාය වනු ඇත.